


# අපනයන ක්‍රියා පටිපාටිය



































Published by: *Trade Facilitation & Trade Information Division* | Sri Lanka Export Development Board | 42, Navam Mawatha, Colombo 02, Sri Lanka
Tel : +94 (0)11 230 0705~11 | Fax : +94 (0)11 230 0715, 230 0676 | E-mail : tfti@edb.gov.lk | Web : www.srilankabusiness.com

## 1. අපනයනකරුවෙක් ලෙස ලියාපදිංචි වීම

ඕනෑම වාණිජ වටිනාකමකින් යුත් භාණ්ඩ අපනයනය කිරීමට අපේක්ෂා කරන පුද්ගලයෙකු පහත දැක්වෙන ආයතන සමග ලියාපදිංචි වීම අවශ්‍යවේ.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (TIN හෙවත් බදු හඳුනා ගැනීමේ අංකය / VAT අංකය) (http://www.ird.gov.lk/en/sitepages/default.aspx)
- ශ්‍රී ලංකා රේගුව (http://www.customs.gov.lk)

ඉහත ආයතන සමග ලියාපදිංචි වීම සඳහා අපනයනකරු විසින් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපත හෝ සංස්ථාගත කිරීමේ සහතිකය සහ වෙනත් අදාළ ලේඛන නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ. ඉහත දක්වා ඇති ආයතනවලින් අයදුම්පත් ලබා ගත හැකිය.

## 2. අපනයන සඳහා ලියාපදිංචිය, බලපත්‍ර ලබාගැනීම හා සහතික කිරීම අවශ්‍යවන නිෂ්පාදන

| | **නිෂ්පාදනය** | **බලපත්‍ර/අවසරපත්‍ර/සහතික** | **බලපත්‍ර/සහතික නිකුත් කිරීම සඳහා අදාළ වගකිවයුතු ආයතනය** |
|---|---|---|---|
| 1. | තේ | තොග වශයෙන් යවන තේ (Bulk Tea) සඳහා සාමාන්‍ය වෙන්දේසි මිල (AAP) සහතික කිරීම | ශ්‍රී ලංකා තේ මණ්ඩලය |
| 2. | දියමන්ති, මැණික් සහ ස්වර්ණාභරණ | මැණික් වෙළඳ බලපත්‍ර | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) |
| 3. | ආහාර හා බීම වර්ග | | |
| | A. මස් නිෂ්පාදන | එක් එක් නැව් තොග සඳහා වෙන්වූ සෞඛ්‍ය සහතික<br><br>ISO, HACCP හෝ GMP සමග මධ්‍යස්ථාන සහතික නිකුත්කිරීම (සහතික වලින් එකක්වත්) | සත්ව නිරෝධායන ආයතනය, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br><br>ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| | B. බියර් | සුරාබදු කොන්දේසි වලට යටත්ව කරන අපනයනයන් සඳහා බලපත්‍රය | සුරාබදු දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | C. මධ්‍යසාරිය පාන වර්ග | සුරාබදු කොන්දේසි වලට යටත්ව කරන අපනයනයන් සඳහා බලපත්‍රය | සුරාබදු දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | D. මධ්‍යසාර නොවන පාන වර්ග (බෝතල් කළ පානීය ජලය / ඛනිජමය ජලය) | අපනයනය සඳහා බලපත්‍ර | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| | E. කජු මද | අනිවාර්ය පූර්ව නැව්තොග පරීක්ෂණ සහතිකය<br><br>ධූමායන සහතිකය | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කාර්මික තාක්ෂණ ආයතනය<br><br>ජාතික ශාක නිරෝධායන සේවය / ඕනෑම බලයලත් පෞද්ගලික ධූමායන සමාගමක් |
| 4. | කුළුබඩු සහ සම නිෂ්පාදන | | |
| | A. සියළුම කුළුබඩු | ප්‍රභවස්ථාන සහතිකය (Country of Origin Certificate) | වාණිජ දෙපාර්තමේන්තුව / වෙළඳ මණ්ඩලය |
| | කුරුඳු | පවිත්‍ර ලංකා කුරුඳු ලාංඡනය (Pure Ceylon Cinnamon Logo) භාවිතය සඳහා බලපත්‍රය<br><br>අනිවාර්ය පූර්ව නැව්තොග පරීක්ෂණ සහතිකය | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය<br><br>ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය / SGS ලංකා (පුද්) සමාගම |
| 5. | ආයුර්වේද සහ ඖෂධ නිෂ්පාදන | | |
| | A. ඖෂධීය නිමි භාණ්ඩ | සෞඛ්‍ය පහසුකම් නිෂ්පාදන ලෙස දේශීය වෙළඳපල සහ අපනයනය සඳහා අනුමැතිය ලබාදීම | ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පත් කරන ලද ඖෂධ නියාමන කාරක සභාව |
| | B. ඖෂධීය සුවඳ විලවුන් සහ ආලේපන | නිෂ්පාදන බලපත්‍රය<br><br>තත්ත්ව/හැඳින්වීමේ සහතිකය | විලවුන් උපකරණ සහ ඖෂධ නියාමන අධිකාරිය<br><br>කාර්මික තාක්ෂණ ආයතනය (ITI), සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඖෂධීය සහ රූපලාවන්‍ය නිෂ්පාදන අංශය |

| | | | |
|---|---|---|---|
| | C. ඖෂධ පැළෑටි | වාණිජමය ප්‍රමාණයේ අමු හෝ වියළි ආයුර්වේදීය ද්‍රව්‍ය අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ආයුර්වේද දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| 6. | පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන | වියළි පොල් / නැවුම් පොල් / පොල් කොළ නිෂ්පාදන අපනයනය සඳහා බලපත්‍ර | පොල් සංවර්ධන අධිකාරිය (CDA) |
| 7. | පළතුරු සහ එළවළු | පැළෑටි නිරෝධායන සහතිකය | ජාතික ශාක නිරෝධායන සේවය |
| 8. | ඛනිජ | නොනිමි හා අර්ධ නිමි ආකාරයේ ඛනිජ ද්‍රව්‍ය සඳහා අපනයන බලපත්‍රය | භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය |
| 9. | ලී භාණ්ඩ | | |
| | A. ලී ඇතුළු කොට හා ඉරණලද දැවමය වටිනාකම එකතු කළ නිෂ්පාදන | අපනයනය සඳහා බලපත්‍රය | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| | B. දැවමය සෙල්ලම් බඩු හා ගෘහ භාණ්ඩ | අපනයන බලපත්‍රය | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 10. | මාළු සහ ධීවර නිෂ්පාදන | - මුහුදු කුඩැල්ලන්, පොකිරිස්සෝ, හක්ගෙඩි සඳහා මුහුදු අපනයන බලපත්‍රය | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව |
| | | - යුරෝපා සංගමයේ රටවල් සඳහා සහතිකය | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව |
| | | - මාළු ඇල්ලීමේ සහතිකය | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව |
| | | - ඇස්ගෙඩි කෙලවල්ලා (Bigeye Tuna) සඳහා සංඛ්‍යාත්මක ලියවිල්ල | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව |
| | | - සප්පරා (Swordfish) සඳහා ICCAT සහතිකය | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව |
| | | - ප්‍රභවස්ථාන සහතිකය | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව |
| | | - GSP ආකෘතිය A | වාණිජ මණ්ඩලය වාණිජ දෙපාර්තමේන්තුව |
| 11. | විසිතුරු මසුන් | පැළෑටි නිරෝධායන සහතිකය | සත්ව නිරෝධායන ස්ථානය |

| | | | |
|---|---|---|---|
| 13. | කාබනික කෘෂි අපනයන | කාබනික සහතිකය<br>(උදා - EU, USDA-NOP, JAS)<br><br>ජාතික කාබනික අපනයන ඒකකයේ ලියාපදිංචි වීම | ප්‍රතිෂ්ඨාපනය වී ඇති සහතික කිරීමේ ආයතන<br><br>ජාතික කාබනික පාලන ඒකකය |

## 2.1 භාණ්ඩ වර්ග අනුව ලියාපදිංචිය

පහත සඳහන් භාණ්ඩ අපනයනකරුවන් අදාල ආයතන හා බලධාරීන් සමග වාර්ෂිකව ලියාපදිංචි විය යුතුය.

### a) තේ (Tea)

තේ අපනයනකරුවන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියා පදිංචි විය යුතුය. මෙසේ ලියාපදිංචි වීම සඳහා අපනයනකරු පහත සඳහන් කරුණු සම්පූර්ණ කළ යුතුය.

- නිසි පරිදි ලියා පදිංචි කල ව්‍යාපාර නාමයක් තිබීම.
- ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම (අවම වශයෙන් රුපියල් දශ ලක්ෂයක කාරක ප්‍රාග්ධනයක් තිබිය යුතුය. මෙය තම බැංකුවෙන් ලබාගන්නා සහතිකයක් මගින් තහවුරු කල යුතුය)
- තේ ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ගබඩා කිරීමේ පහසුකම් තිබිය යුතුය.

මෙම සියලු කරුණු සම්පූර්ණ කල විට තේ අපනයනකරුවකු වශයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විය හැක. අයදුම්පත්‍ර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අපනයන අංශයෙන් ලබාගත හැක.

ලියාපදිංචි ගාස්තු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| මුල් ලියාපදිංචි ගාස්තුව | - | රු. 50,000/= +(VAT) |
| තේ ඇසුරුම් ලියාපදිංචි ගාස්තුව | - | රු. 10,000/= +(VAT) |
| තේ ගබඩා ලියාපදිංචි ගාස්තුව | - | රු. 25,000/= +(VAT) |

මෙම ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කළ යුතුය. නැවත ලියාපදිංචියට ගාස්තු අදාල වේ.

වැඩි විස්තර සඳහා - ශ්‍රී ලංකා තේ මණ්ඩලය, නො. 574, ගාලු පාර, කොළඹ 03.
දුරකථන - 011-2587814 / 011-2553652
වෙබ් අඩවිය - www.pureceylontea.com

### b) පොල් හා පොල් නිෂ්පාදන

පොල් හා පොල් නිෂ්පාදන අපනයනකරුවන් පොල් සංවර්ධන අධිකාරියේ (CDA) වාර්ෂිකව ලියාපදිංචි විය යුතුය. ලියාපදිංචි ගාස්තු පහත පරිදි වේ.

පොල් මද ආශ්‍රිත නිෂ්පාදන (කොප්පරා, වියළි පොල්, පොල් තෙල්, පොල් කිරි ආදිය) : රු. 10,000/= +බදු
අර්ධව සකස් කරන ලද පොල් (කාණ්ඩ B ) : රු. 500,000/= + බදු (පොල් ගෙඩි 30000 ට නොවැඩි නම් : රු.50,000/= + බදු)
පොල් මදය ආශ්‍රිත නොවන (කාණ්ඩ C, D, E ) : රු. 10,000/= + බදු
අනිකුත් පොල් නිෂ්පාදන (කාණ්ඩ F ) : රු. 5,000/= + බදු
සකස් නොකරන ලද පොල් ගෙඩි - තැඹිලි (කාණ්ඩ C, D, E ) : රු. 5,000/= + බදු

වැඩි විස්තර සඳහා - අලෙවි අංශය, පොල් සංවර්ධන අධිකාරිය, නො. 11, ඩියුක් පාර, කොළඹ 01.
දුරකථන - 0112 421 028
වෙබ් අඩවිය – www.cda.lk

## c) මැණික් හා ස්වර්ණාභරණ

මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් (National Gem & Jewellery Authority) මැණික් ගනුදෙනු බලපත්‍රයක් (Gem Dealers Licence) ලබාගත යුතුය. මෙම බලපත්‍රයේ ගාස්තුව තීරණය කරනු ලබන්නේ ගනුදෙනු කරන අවස්ථාව වන විට තමන් සන්තකයේ ඇති මැණික් තොගයේ වටිනාකම අනුවයි.

වැඩි විස්තර සඳහා - ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, නො. 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03
දුරකථන - 0112 390 645
වෙබ් අඩවිය - www.ngja.gov.lk

## d) රෙදිපිළි හා නිමි ඇඳුම්

ඇගලුම් අපනයනකරුවන්, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ, ඇගලුම් අපනයන සේවා අංශයේ (Apparel Export service Unit) ලියා පදිංචි විය යුතුය. ආයෝජන මණ්ඩල පණත යටතේ ලියාපදිංචි සියලුම ව්‍යවසායකයන් ආයෝජන මණ්ඩලය සමග ලියාපදිංචි විය යුතුය.

වෙබ් අඩවි:

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය - www.industry.gov.lk
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - www.investsrilanka.com

## 3. අපනයනය සඳහා අවසර/නිර්දේශ ගත යුතු භාණ්ඩ - (Items under License control)

පහත සඳහන් භාණ්ඩ ආනයන හා අපනයන පාලක විසින් නිකුත් කරන ලද අපනයන බලපත්‍රයකට යටත් වේ.

| | **භාණ්ඩය** | **නිර්දේශ කිරීමේ පාලන අධිකාරිය** |
|---|---|---|
| 1. | කොරල් සහ හක් බෙල්ලන් | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තෙමේන්තුව |
| 2. | ලී ඇතුළු කොට හා ඉරණලද දැව | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 3. | යකඩ කුඩු, යකඩ කුට්ටි සහ බොර | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය |
| 4. | ඇත්දළ හා ඇත්දළ නිෂ්පාදන | වන ජීවි දෙපාර්තමේන්තුව |
| 5. | 1945.01.01 දිනට පෙර ලියා පදිංචි මෝටර් රථ | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |

අපනයනයට සීමා පැනවූ භාණ්ඩ සඳහා අපනයන පාලන බලපත්‍ර ක්‍රියාපටිපාටියන් පිලිබඳ මාර්ගෝපදේශ ලබාගැනීමට පිවිසෙන්න. http://www.imexport.gov.lk/web/images/PDF_upload/Guidelines/export.pdf

## 4. අපනයනය සඳහා තහනම් භාණ්ඩ - (Items prohibited for Exports)

1. පණ ඇති හෝ මියගිය සතුන් සහ කොටස් (පර්යේෂණ සහ විදෙස් සත්වෝද්‍යාන / කෞතුකාගාර අතර සිදුකෙරෙන හුවමාරු සඳහා බලපත්‍ර ලබාගත යුතුය)
2. පුරාවස්තු සහ සංස්කෘතික දේපල
3. සියලුම වර්ගයේ අන්තරායකර මත්ද්‍රව්‍ය
4. පුපුරණ ද්‍රව්‍ය හා අවි ආයුධ
5. සජීවී මත්ස්‍යයින් (ආවේණික හා වඳවීමේ තර්ජනයට ලක් වී ඇති ප්‍රභේද)
6. ස්වාභාවික ඛනිජ ද්‍රව්‍ය
7. අසභ්‍ය ප්‍රකාශන හා පුවත්පත්
8. වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනතේ දක්වා ඇති ආරක්ෂිත ශාඛ හා පැලෑටි ආදිය

## 5. අපනයන විකුණුම් ගිවිසුම

යම්කිසි වෙළඳ ගණුදෙනුවක් ක්‍රියාත්මක විම සඳහා විකුණුම්කරු හා ගැණුම්කරු වෙළඳ ගිවිසුමකට එළැඹිය යුතුය. මෙම සියළු විස්තර අඩංගු නාම මාත්‍ර ඉන්වොයිසියක් (Proforma Invoice) විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත යැවිය යුතුය. සමහර අවස්ථාවලදී ගැනුම්කරු විසින් භාණ්ඩයේ සාම්පලයක් (Sample) ඉල්ලා සිටිය හැක. මෙසේ යවන සාම්පල වල වටිනාකම රු 50,000/= නොඉක්මවිය යුතුය. බොහෝ විට මේවා යැවෙන්නේ ගුවන් මගිනි. නමුත් රන්, රිදී, මැණික් හා ප්ලැටිනම් මෙසේ සාම්පල වශයෙන් යැවිය නොහැක.

නාම මාත්‍ර ඉන්වොයිසියක (Proforma Invoice) පහත සඳහන් කරුණු ඇතුලත් විය යුතුය

මෙහිදී දෙපාර්ශ්වය අතර මිළ ගණන්, මුදල් ලබා ගන්නා ආකාරය, ප්‍රමාණයන්, භාණ්ඩ නැව්ගත කරන ආකාරය, භාණ්ඩයේ තත්වය, ආදිය පිළිබඳ නිගමනයකට එළැඹිය යුතුය

- භාණ්ඩ පිළිබඳ විස්තර
- ප්‍රමාණයන්
- මිළ
- අපනයනය සඳහා මුදල් ලබාගන්න ආකාරය (L/C, D/P, D/A යනාදිය)
- ප්‍රවාහන කොන්දේසි (FOB, CFR, CIF යනාදිය)
- ඇසුරුම් කිරීම සහ සලකුණු විස්තර

<u>ප්‍රවාහන කොන්දේසි (Terms of Delivery) මත මිල තිරණය වේ.</u>

FOB, CFR,CIF යනු ජාත්‍යන්තර වශයෙන් සම්මත මිල තිරණය කිරීමේ ක්‍රම කිහිපයකි. එමගින් පිරිවැය (බහලුම් ගාස්තු) අවදානම් රක්ෂණ හා රේගු නිෂ්කාශනය යන වියදම් අදාලව විකුණුම් මිලෙහි ඇතුළත් වියයුතු දේ පිළිබඳව ගැනුම්කරු සහ විකුණුම්කරු අතර එකඟතාවයකට පැමිණිය යුතුය.

(1) නැව තෙක් වියදම් සහිත (F.O.B – Free on Board) මිල

මෙම ක්‍රමය අනුව නැවතෙක් දැරිය යුතු වියදම් අපනයනකරුට දැරීමට සිදුවේ. බොහෝ විට මෙහිදී භාණ්ඩ පටවන වරාය සඳහන් කිරීම සිරිතකි. මෙම ගිවිසුම අනුව අපනයනකරු භාණ්ඩ නැවට පැටවූ පසු සියළුම වගකීම් වලින් මිදේ. එනම් භාණ්ඩවලට යම් හානියක් හෝ පාඩුවක් වේනම් එම වගකීම ආනයනකරු විසින් දැරිය යුතුය.

(2) වියදම් සහ නැව් ගාස්තු සහිත (C.N.F/C.F.R – Cost & Freight) මිල

මෙම ක්‍රමය යටතේ අපනයනකරු භාණ්ඩවල මිල සමග ගමනාන්ත වරාය දක්වා නැව් ගාස්තු (Freight Charges) දැරිය යුතුය. මෙම ගිවිසුම අනුව නැවට පැටවූ පසු භාණ්ඩවලට හානි හෝ පාඩු සිදුවුයේ නම්, එම වගකීම ආනයනකරු විසින් දැරිය යුතුය.

(3) වියදම්, රක්ෂණ හා නැව් ගාස්තු සහිත (C.I.F – Cost, Insurance & Freight) මිල

මෙම ක්‍රමය යටතේ අපනයනකරු වරාය වෙත භාණ්ඩ ගෙන යෑම සහ පැටවුම් වියදම්, රක්ෂණ ගාස්තු හා නාවික ගාස්තු යනාදි වියදම් දැරිය යුතුය. භාණ්ඩවලට සිදුවිය හැකි හානි, අලාභ සඳහා රක්ෂණ විය යුතුය. අපනයනකරු රක්ෂණ සමාගමක් සමග ගිවිසුමකට එළැඹ නියමිත රක්ෂණ වාරිකය ගෙවිය යුතුය. රක්ෂණ සහතිකයද ලබා ගත යුතුය.

## 6. අපනයනය සඳහා මුදල් ලබාගන්නා ආකාර

අපනයනකරු හා ආනයනකරු අතර ඇති වන වෙළඳ ගිවිසුම්හිදී භාණ්ඩ සඳහා මුදල් ගෙවීම තීරණයවේ. මෙය තීරණය වන්නේ දෙපක්ෂය අතර ඇති අන්‍යෝන්‍ය අවබෝධයත්, භාණ්ඩ ප්‍රමාණයේ වැදගත්කමත්, ඒ ඒ භාණ්ඩ පිළිබඳ වෙළඳපොලේ ඇති තරඟකාරීත්වය හා වෙළඳ ප්‍රතිපත්ති ආදි කරුණු මතය.

දැනට සාමාන්‍යයෙන් භාවිතා වන ගෙවීම් ක්‍රම කිහිපයක් මෙසේ දැක්විය හැක.

a. භාණ්ඩ නැව්ගත කිරීමට පෙර මුදල් ගෙවීමේ ක්‍රමය
b. ණයවර ලිපි (LC)
c. ලියවිල මත එකතුව
   - ගෙවීම් පිට ලියවිලි (DP)
   - ප්‍රතිග්‍රහනය මත ලියවිලි (DA)
d. විවෘත ගිණුම් ක්‍රමය
e. තොග ගිණුම් ක්‍රමය

### A. භාණ්ඩ නැව්ගත කිරීමට පෙර මුදල් ගෙවීමේ ක්‍රමය (Advance Payment)

මෙම ක්‍රමය යටතේ ආනයනකරුවා විසින් අපනයනකරු වෙත භාණ්ඩ නැව්ගත කිරීමට ප්‍රථම මුදල් එවනු ලබයි. මෙම මුදල් ජාත්‍යන්තර මුදල් ඇණවුමක් මගින් හෝ විදුලි පැවරුමක් (Telegraphic Transfer) මගින් හෝ බැංකු අණකරයක් (Bank Draft) මගින් හෝ ගෙවිය හැක.
මෙලෙස මුදල් ගෙවීම නිසා අපනයනකරුට මුදල් නොලැබිය යන සැක ඇති නොවේ.

### B. ණයවර ලිපි (LC)

මෙම ක්‍රමය යටතේ දෙපාර්ශ්වය අතර ඇති කර ගත් ගිවිසුම අනුව කටයුතු කරන්නේ නම්, ආනයනකරු විසින් (Buyer) තම රටේ බැංකුව මාර්ගයෙන් අපනයනකරුගේ (Exporter) නමට ණයවර ලිපියක් විවෘත කිරීමෙන් අපනයනකරුවාට මුදල් ලබාගත හැකිවේ. එනම්, ආනයනකරු තම රටේ බැංකුව මාර්ගයෙන් භර ගිණුමක් විවෘත කිරීමයි. මෙම භර කිරීම කරනු ලබන්නේ අපනයනකරුවා විසින් ගිවිසගත් අන්දමට ක්‍රියාකර ඇති බව බැංකුව සෑහීමකට පත්වන්නේ නම් පමණි. වෙනත් විදියකට කියනවා නම් ණයවර ලිපියක් විවෘත කිරීම යනු ගැනුම්කරුවා වෙනුවෙන් ගැනුම්කරුවාගේ බැංකුව (Buyer's Bank) අපනයනකරුවාට මුදල් ගෙවන බව කොන්දේසි සහිත පොරොන්දු වීමයි.

### C. ලේඛනමය එකතුකිරීම (Documentary Collection)

විකිණුම්කරු තම රටෙහි බැංකුවක සේවාවන් භාවිතා කරයි (පැවරීමේ බැංකුව). එවිට පැවරීමේ බැංකුව ගැණුම්කරුගෙන් මුදල් ලබාගැනීම සඳහා ගැණුම්කරු සිටිනා රටේ බැංකුවක (එකතුකිරීමේ බැංකුව) සේවය ලබාගනී. ගැනුම්කරුගේ බැංකුව (එකතුකිරීමේ බැංකුව) තුල කටයුතු නිවැරදිව සිදුවන්නේ නම් ගෙවීම් එකතුකර ප්‍රේෂණයද එසේම සිදුකෙරේ.

ලේඛනමය එකතුකිරිම (Documentary Collection) අංග දෙකක් යටතේ වර්ගීකරණය කළහැක.

I. <u>ගෙවීම පිට ලියවිලි (ඩී/පී ක්‍රමය) - (Documents against Payment) (D/P)</u>

අපනයනකරු භාණ්ඩ නැව්ගත කොට ප්‍රධාන අපනයන ලියවිලි එනම් විනිමය බිල්පත සමග නෞභාර පත්‍රය (Bill of Lading), රක්ෂණ සහතිකය, ඉන්වොයිසිය (Invoice), ප්‍රභවස්ථාන සහතිකය (Certificate of origin), ඇසුරුම් සහතිකය (Packing list) හා වෙනත් අදාල සහතික ආනයනකරුගේ බැංකුව වෙත යවනු ලබයි.

මේ අනුව ආනයනකරු තම බැංකුව මාර්ගයෙන් විනිමය බිලට මුදල් ගෙවා එයට අමණා ඇති මෙම අපනයන ලියවිලි භාරගෙන භාණ්ඩ වරායෙන් මුදා ගනී. මෙම මුදල් ආනයනකරුගේ බැංකුව විසින් අපනයනකරුවාට එවනු ලබයි. ආනයනකරු විනිමය බිලට මුදල් නොගෙවුවහොත් මෙම අපනයන ලියවිලි ඔහුට නොලැබේ. එවිට ඔහුට වරායෙන් භාණ්ඩ මුදවා ගත නොහැක.

II. <u>ප්‍රතිග්‍රහණය මත ලියවිලි (ඩී/ඒ ක්‍රමය) - (Documents against Acceptance) (D/A)</u>

මෙම ක්‍රමය අනුව ආනයනකරු සිය බැංකුවට ගොස් අපනයනකරු විසින් කෙලින්ම බැංකුවට එවා ඇති විනිමය බිල ප්‍රතිග්‍රහණය කර එයට අමුණා ඇති, අපනයන ලියවිලි බාරගෙන වරායෙන් භාණ්ඩ මුදා ගනී. ආනයනකරු එම විනිමය බිලට මුදල් ගෙවන්නේ කල්පිරුණු පසුවයි.

### D. විවෘත ගිණුම් ක්‍රමය (Open Accounts)

විවෘත ගිණුම් ක්‍රමය යටතේ අපනයනකරු විසින් මුදල් ලබා ගැනීමට පෙර ආනයනකරු වෙත භාණ්ඩ නැව්ගත කරනු ලබයි. අපනයනකරු හා ආනයනකරු ගිවිසගත් පරිදි යම් ඉදිරි දිනයකදී මුදල් ගෙවන බවට ආනයනකරු අපනයනකරුට පොරොන්දු වෙයි. මෙම ක්‍රමය යටතේ අපනයනකරුට මුදල් හා භාණ්ඩ සම්බණ්ධව අවධානමක් දැරීමට සිදුවේ. එම නිසා මෙම ක්‍රමය යටතේ අපනයනය කරනු ලබන්නේ අපනයනකරු හා ආනයනකරු ඉතා හොඳින් දැන හඳුනනවා නම් පමණි.

### E. තොග ගිණුම් ක්‍රමය (Consignment Accounts)

මෙය විවෘත ගිණුම් ක්‍රමයට තරමක් දුරට සමානය.  තොග ගිණුම් ක්‍රමය යටතේ අපකනයනකරු හා ආනයනකරු ගිවිස ගත් පරිදි අපනයනකරු මුදල් ලබා ගැනීමට පෙර ආනයනකරු වෙත භාණ්ඩ නැව්ගත කරනු ලබයි. ආනයනකරු භාණ්ඩ විකුණූ පසු එම මුදල් විකුණුම් ගිණුමක් සමග බැංකු මාර්ගයෙන් අපනයනකරු වෙත එවනු ලබයි.

## 7. වෙළඳ සාම්පල යැවීම

වෙළඳ ගණුදෙනු සිදු වීමට පෙර විදේශිය ගැනුම්කරු විසින් නිෂ්පාදන සාම්පල ඉල්ලා සිටිය හැක. එවැනි අවස්ථාවකදී අපනයනකරු තම නිෂ්පාදනවල සාම්පල විදේශිය ගැනුම්කරු වෙත යවනු ලබයි. ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා සාමාන්‍යයෙන් සාම්පල ගුවන් තැපෑලෙන් යවනු ලැබේ. රු. 50,000 දක්වා වූ වෙළඳ සාම්පල නිදහසේ අපනයනය කළ හැකි අතර ඒ සඳහා රේගු ප්‍රකාශන ආකෘතිය (CUSDEC 1/11) ඉදිරිපත් කිරීම පමණක් ප්‍රමාණවත්ය. අපනයනය කළයුතු වෙළඳ සාම්පල ඒකක ප්‍රමාණය රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් තිරණය කරනු ලැබේ. කෙසේ වෙතත්, මැණික් හා ස්වර්ණාභරණ සාම්පල ලෙස යැවීමට අවසර නොමැත.

## 8. ඇසුරුම්කරණය

ඇසුරුම්කරණය යනු නිෂ්පාදනයක් වෙළඳපොල තුල ස්ථානගත කිරීම සඳහා දායක වන වැදගත් අංගයකි. ඇසුරුම්කරණය මගින් භාණ්ඩය අපනයනකරුගේ සිට අවසාන පාරිභෝගිකයා වෙත ලැබෙන තුරු ආරක්ෂා කළ යුතුය.

ඒ අනුව අපනයනකරු විසින් පහත සඳහන් කරුණු ඉටුකල යුතුය.

1. මුහුදු/ගුවන් ප්‍රවාහනයෙහි දී රළු හැසිරවීම් වලට ඔරොත්තුදීම සඳහා නිවැරදි ලෙස ඇසුරුම්කිරීම.
2. ගැනුම්කරුගේ අවශ්‍යතා හා වෙළඳ ගිවිසුමට අනුව ඇසිරීම සිදු කිරීම.
3. සියලු ඇසුරුම් මත ගමනාන්ත සලකුණු සහ ගමනාන්තය නම් කිරීම.
4. රේගු නිලධාරීන්ට පරීක්ෂා කිරීම පහසු කිරීම සඳහා භාණ්ඩ පොදි ඇසුරුම් කිරීම.

## 9. අපනයන භාණ්ඩ ඇසුරුම්කරණයේදී සැලකිය යුතු වෙනත් වැදගත් කරුණු

**අපනයන වෙළඳපොළෙහි නීති රීති** - ඔබේ නිෂ්පාදනය වෙළෙඳපොළ රෙගුලාසි වලට අනුකූලදැයි පරීක්ෂා කරන්න. සමහර සළකුණු හෝ ලේබල් ඇතැම් රටවලදී අවශ්‍ය විය හැකි අතරම, ඇතැම් ඇසුරුම් ද්‍රව්‍ය සඳහා අවසර නැත.

**දැව ඇසුරුම්කරණ සඳහා සීමා කිරීම්** - ජාත්‍යන්තර ශාක ආරක්ෂණ සම්මුතිය (IPPC) ට අනුව ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිතා කරන දැව ඇසුරුම් අනවශ්‍ය කෘමි උවදුරු පැතිරීම වලක්වන පරිදි සිදුවිය යුතුය. ප්‍රතිකාර ක්‍රමයන් මෙතිල් බ්‍රෝමයිඩ් සමග තාප පිරියම් කිරීම හෝ ධූමායනය කිරීම විය හැක. IPPC මහ ලේකම් කාර්යාලය මගින් අන්තර්ජාතික වෙළඳාම තුළ දැව ඇසුරුම්කරණය නියාමනය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ (ISPM 15) 15 ක් (ශාක නිරෝධායනය පිළිබඳ ජාත්‍යාන්තර ප්‍රමිති) නිකුත් කර ඇත. බොහෝ අවස්ථාවල දී ඔබේ ඇසුරුම්කරණය ISPM 15 ට අනුකූලදැයි පරීක්ෂා කිරීම ප්‍රමාණවත් වේ.

**ඇසුරුම්කරණ අපද්‍රව්‍ය** - කිසියම් ඇසුරුම්කරණයක අවශ්‍යතාවය, ඇසුරුමේ හැඩය යනදෑ නිෂ්පාදනයේ අලෙවිකරණ අදියරයන් අනුව සලකා බලා වෙළඳපොළ සමීක්ෂණයකින් පසුව නිගමනය කලයුතුය. සැමවිටම ඉලක්කය විය යුත්තේ අනවශ්‍ය අසුරුම්කරණයන් අවම කිරීමය. ඇසුරුම් කරණයේදී 3R ධූරාවලිය අනුගමනය කල යුතුය එනම් Reduce - අවමකිරීම, Reuse - නැවත භාවිතය, Recycle - ප්‍රතිචක්‍රීකරණය. බොහෝ අපනයන වෙළඳපොළවල් තුල ඇසුරුම්කරණ අපද්‍රව්‍ය පිළිබඳ දැඩි නීති රීති පවතී. උදා): ජර්මනියේ Green Dot System oelaúh yel.

**අන්තරායකාරී භාණ්ඩ** - අපනයනයට සුදානම් සෑම අන්තරායකාරී භාණ්ඩයක්ම සුරක්ෂිතව ඇසුරුම් කර පැහැදිලිව සලකුණු යොදා ලේබල් කලයුතුය. මෙවැනි අපනයනයන් ප්‍රවාහනයට යොදාගන්නා මාධ්‍ය අනුව ඒවාට අදාළ නීති රීති තරමක් වෙනස් වේග

**රක්ෂණාවරය** - නිවැරදිව ඇසුරුම් කර නොමැති නම් රක්ෂණ ආවරණයක් ඉල්ලුම්කිරීමේදී අවාසි වියහැක. එනම් අසුරුකිරීමේ දුර්වලතා හේතුවෙන් ඔබේ භාණ්ඩවලට හානි සිදුවී ඇති බවට රක්ෂණ ආයතනය විසින් ප්‍රකාශකිරීමට හැකියාව ඇත.

**ගිවිසුම්ගතවීම** - තැනින් තැනට ගෙනයාමේදී භාණ්ඩ වලට සිදුවන හානි නිසා ඇතිවන ආරවුල් මගහරවා ගැනීම සඳහා ගැනුම්කරුවන් සමග ගිවිසුම්ගතවන අවස්ථාවලදී එයට ඇසුරුම් නියමයන්ද ඇතුලත් කිරීමට සලකා බලන්න.

## 9ග භාණ්ඩ තොග සඳහා ඉඩපහසුකම් වෙන්කිරීම :සඍැරඬ්එසදබ දඅ ජ්රටද ි ්ජැ-

A. නැව් භාණ්ඩ තොග ජ් ් ස්රටද

භාණ්ඩ නැව්ගත කිරීමේ දිනට පෙර නැවෙහි ඉඩ වෙන්කරගැනීම කළයුතුය. එමනිසා, අපනයනකරු නැවෙහි ඉඩ වෙන් කර ගැනීම සඳහා නැව් නියෝජිතයා හමුවිය යුතුය. මේ වෙනුවෙන් අපනයනකරු නිසි පරිදි සම්පූර්ණ කරන ලද නැව්ගත කිරීමේ සටහන ˆයසවවසබට හදඑ (ඇඩජග 3 ආකෘති පත්‍රය - පිටපත් 3ක්) නැව් නියෝජිතයා වෙත ඉදිරිපත් කළ යුතුය.

වැඩිදුර විස්තර සඳහා ඨ යඑඑචඨරුරුඅඅඅගිකව්ගකනරුෑෂීැරඩසජීගීවරුජයනු3ඃ

## B. ගුවන් භාණ්ඩ තොග ජ්‍ර්සර ස්රටද

ගුවනින් යවන භාණ්ඩ තොග වලට ඉඩපහසුකම් වෙන්කර ගැනීම සඳහා අදාළ රට අනුව අපනයනකරුවන්ට ගුවන් සේවා නියෝජිතයන් සමග කටයුතු කිරීමට සිදුවේ. අපනයනකරු විසින් ඔවුන් වෙත ˆයසවවැටි සබ්එරමජඑසදබ් දෙර ාසිව්එජය ලියවිල්ල ඉදිරිපත් කල යුතුය. එය භාවිතයෙන් ගුවන්යානා බිල්පත ඃඋප - ්සරඅ්භ ඊසකක- ලේඛනය නිකුත් කරනු ලැබේ. ගුවන්යානය පැමිණෙන වේලාවට පෙර අදාළ භාණ්ඩ තොග ගුවන් තොටුපළ වෙත රැගෙන ආ යුතුය. එම කාලයන් (ක්‍මඑ ධෙෙ ඔසපැ) භාණ්ඩ වර්ග අනුව වෙනස් වේ.

| | භාණ්ඩ වර්ගය | ක්‍මඑ ධෙෙ ඔසපැ :ගුවන්යානය පිටත්ව යෑම සඳහා සම්මත වේලාවට පෙර- |
|---|---|---|
| 01 | සාමාන්‍ය භාණ්ඩ | පැය 12 |
| 02 | බුලත් රැ ධධ්‍ය රැ ඪ්බ භාණ්ඩ | පැය 06 |
| 03 | එළවළු පළතුරු වැනි නරක්වන සුළු භාණ්ඩ (බුලත් හැර) | පැය 05 |
| 04 | ටූනා මාළු ඇතුළු ආහාරයට ගන්නා මාළු තොග කිලෝග්‍රෑම් 50 දක්වා | පැය 05 |
| 05 | පිවි මසුන් | පැය 04 |
| 06 | පුවත්පත් සහ විවිධ ප්‍රකාශන | පැය 03 |
| 07 | සජීවී සතුන් / රාජ්‍ය තාන්ත්‍රික තැපැල් / මානව ශාරීරික කොටස් (ඇඹඑ) සහ සජීවී මානව ඉන්ද්‍රියන් (බ්‍යධ) | පැය 02 |

## 10. අපනයන සඳහා අවශ්‍ය සහාඨ කිරීමේ සහතික

### A. ප්‍රභවස්ථාන සහතිකය (GSP සහතිකය) - Certificate of Origin (GSP Certificate)

මෙය වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අතර ආනයනය කරනු ලබන රටෙහි රේගුව වෙත මෙම සහතිකය ඉදිරිපත් කළ යුතුය. සියළුම GSP සහන, නිදහස් වෙළඳ ගිවිසුම් සහ බහුපාර්ශවික වෙළඳ ගිවිසුම් වලට අදාළ ප්‍රභවස්ථාන සහතික (CCO) නිකුත් කිරීමේ වගකීම වාණිජ දෙපාර්තමේන්තුව සතුවේ. වැඩිදුර විස්තර සඳහා - http://www.doc.gov.lk

### B. ප්‍රභවස්ථාන සහතිකය - Certificate of Origin

මෙම සහතිකයද ආනයනය කරනු ලබන රටෙහි රේගුව වෙත ඉදිරිපත් කිරීම කළ යුතුය. එය නිකුත් කරනු ලබන්නේ වාණිජ මණ්ඩල මගිනි.
උදා: ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය හෝ ජාතික වාණිජ මණ්ඩලය

### C. තත්ත්ව සහතිකය

මෙය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් නිකුත් කරනු ලැබේ. පෞද්ගලික තත්ත්ව සහතිකයන් SGS ලංකා (පුද්ගලික) සමාගම විසින් නිකුත් කරනු ලැබේ.

D. සෞඛ්‍ය සහතිකය

ආනයනය සිදුකරනු ලබන රටෙහි සෞඛ්‍ය බලධාරීන් විසින් සෞඛ්‍ය සහතිකය ඉල්ලම් කරනු ලැබිය හැකිය, මස්, මාළු සහ සජීවී සතුන් අපනයනය කරනා විටදී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් මෙම සහතිකය නිකුත් කරනු ලැබේ. ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන සෞඛ්‍ය සහතික සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන කළමනාකරණ අංශය විසින් නිකුත් කරනු ලැබේ.

E. පැළෑටි නිරෝධායන සහතිකය

විසිතුරු මල්, අතු කොළ සහිත පැළෑටි, එළවළු සහ පළතුරු වැනි දෑ අපනයනය කරන විට ආනයනය සිදුකරනු ලබන රට විසින් මෙම සහතිකය ඉල්ලා සිටනු ලබයි. මෙම සහතිකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශාක නිරෝධායන සේවාව විසින් නිකුත් කරනු ලැබේ.

F. ධූමායන සහතිකය

විසිතුරු මල්, කොළ සහ අතු සහිත පැළෑටි, තල ඇට, කජු, තේ ආදී වැනි කෘෂිකාර්මික නිෂ්පාදන ආනයනය කරනු ලබනා විට ගැණුම්කරු හෝ එරට රජය විසින් මෙම සහතිකය ඉල්ලා සිටිය හැකිය. ධූමායන කටයුතු සිදු කරනු ලබන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළෑටි නිරෝධායන සේවය මගිනි. එම දෙපාර්තෙමින්තුව විසින් අනුමත කරන ලද සමහර පුද්ගලික සමාගම් විසින්ද මෙම කටයුතු සිදුකරනු ලබයි.

## 11. රේගු ක්‍රියාවලිය

### A. රේගු ප්‍රකාශනය සැකසීම

1. රේගු ප්‍රකාශනය (Custom Declaration Form - CUSDEC)

ජාත්‍යන්තර වෙළඳාමේදී වෙළඳ භාණ්ඩ දේශසීමාවන් ඉක්මවායන විටදී වෙළඳාමේ නිරත වන පාර්ශ්වයන් විසින් ආනයනය හෝ අපනයනය කරන භාණ්ඩ පිළිබඳ විස්තර ඇතුලත් ප්‍රකාශනයක් දේශ සීමාවන් දෙපස එනම් වාරයක, ගුවන්තොටුපලක හෝ දේශ සීමා මුරපොළක රැඳී සිටින්නා වූ බලයලත් අධිකාරියන් වෙත ලබාදිය යුතුය. මෙම ප්‍රකාශනය "අපනයන සටහන්කරය" ලෙස හඳුන්වයි. ශ්‍රී ලංකාවේදී මෙම අපනයන සටහන්කරය CUSDEC (කස්ඩෙක්) ලෙස හඳුන්වයි.

රේගු ආඥාපනතේ 47 වන වගන්තිය ආනයනය සඳහාද, 57 වන වගන්තිය අපනයනය සඳහාද වේ. සෑම ආනයන / අපනයන භාණ්ඩ වල දත්තයක්ම රේගුව වෙත ප්‍රකාශ කළ යුතුවේ. CUSDEC හි ප්‍රකාශයට පත් කර ඇති තොරතුරු ඉතාමත් වැදගත්ය. එම තොරතුරු ස්ථානීය සම්බන්ධිත හා සංඛ්‍යාත්මක සම්බන්ධිත දත්තයන් වේ. එබැවින්, CUSDEC සම්පූර්ණ කිරිමේදී අතිශයින්ම සුපරීක්ෂාකාරී වන්න.

CUSDEC මාර්ගෝපදේශ සඳහා පිවිසෙන්න:
http://www.customs.gov.lk/public/files/ict/guidelines/cusdecmap.html
http://www.customs.gov.lk/public/files/ict/guidelines/cusdecmap2.html

2. වාණිජ ඉන්වොයිසිය - Commercial Invoice

ඉන්වොයිසිය යනු අපනයන භාණ්ඩ තොග පිළිබඳ සියලු විස්තර සඳහන් කොට අපනයනකරු විසින් සකස් කරන ලද ලියවිල්ලකි. මෙයද අපනයන සැකසුම්කරය (CUSDEC) හා සමාගමීව අපනයන කාර්යාලයේ කටයුතු සිදුවන අවස්ථාවේදී පිරවීම කළ යුතුය. භාණ්ඩයන් ආනයනය කරන රටෙහි රේගු විසින් ඉල්ලාසිටිය හැකි ලේඛන නම් විකුණුම්කරු විසින් දක්වා ඇති මිළ (විකුණුම් මිල) සහ විකුණුම් ගාස්තු පිරිවැය, රක්ෂණ සහ අසුරැම්කිරීමේ

තොරතුරු ආදියයි. මෙම තොරතුරු අවශ්‍යවන්නේ එම ආනයනය සිදු කරන රටේදී ආනයනය කරන භාණ්ඩවල රේගු වටිනාකම තක්සේරු කිරීම සඳහා වේ.

3. ඇසුරුම් ලේඛණය - Packaging List

භාණ්ඩ තොගයන් වල ඇති එක් එක් ඇසුරුම් වල වන අන්තර්ගතය සඳහන් ලේඛනය.

4. වෙනත් ලියකියවිලි (අදාළ නම්)

ඕනෑම අවසරපත්‍රයක් / බලපත්‍රයක්
තේ මිශ්‍රකිරීමේ පත්‍රය
ද්‍රව්‍ය භාවිත පත්‍රය

5. සෘජු වෙළඳ ආදානය - Direct Trader Input (DTI)

සෘජු වෙළඳ ආදානය - DTI මගින් අපනයනකරු හෝ ඔහුගේ නියෝජිතයාට (ප්‍රකාශක - Declarant) සම්පූර්ණ රේගු ක්‍රියාවලිය හෝ එහි විවිධ නියමයන් දුරස්ථව සිට ඔවුන්ගේ නියෝජිත කාර්යාලයේදී සම්පූර්ණ කිරීම සඳහා හැකියාව ලැබේ.

පහත වෙබ් අඩවිය මගින් DTI සඳහා ලියාපදිංචි වන්න:
http://www.customs.gov.lk/public/files/ict/1.3.1.1.2/DTI%20Instructions%20and%20Form%20new.pdf

## B. අපනයන බදු හා සෙස් බදු - Export Duty & CESS Charges

වර්තමානයේදී අපනයනකරුවන් රේගු බදු (Customs duties) ගෙවීමට අවශ්‍ය නැත. එසේ වුවත් සාම්ප්‍රදායික නිෂ්පාදන (තේ, රබර්, පොල් ආදිය) අපනයනය කිරීමේදී රේගුව වෙත CESS බදු ගෙවිය යුතුය.

අපනයනයන් සඳහා වන සෙස් (CESS) ගාස්තු:

**ලේඛනය**

| H.S.Hdg (I) | H.S Code (II) | | Description (III) | Rate of Cess (IV) |
|---|---|---|---|---|
| 05.08 | 0508.00 | | **වැඩ නොදැමූ, හෝ සාමාන්‍යයෙන් සකස් කළ නමුත් වෙනත් ආකාරයකින් වැඩ නොදැමූ, හිරිගල් සහ ඒ හා සමාන ද්‍රව්‍ය ; වැඩ නොදැමූ හෝ සාමාන්‍යයෙන් සැකසූ නමුත් හැඩයකට නොකැපූ, මෘද්වංගීන්ගේ, කවචයින්ගේ හෝ මුහුදු ඉකිරීන්ගේ වර්ගයට අයත් සතුන්ගේ පිටපොතු සහ දැලිපොතු, ඒවායේ කුඩු සහ ඉවතලන දේ :** | |
| | 0508.00.10 | - - - | බෙලිකටු | ඒකක 1,000 ට රු. 100/- |
| 08.01 | | | **අළුත් හෝ වියළි, පොතු ගැලවූ හෝ නොගැලවූ හෝ ලෙලිගැසූ හෝ නොගැසූ, පොල්, බ්‍රසීල ගෙඩි සහ කජු ගෙඩි.** | |
| | | - | පොල් : | |
| | 0801.12 | - - | කටුව (අභ්‍යන්තරාවරණය) සහිත (එන්ඩොකාප්) (ලෙලි ගැසූ පොල්) | ඒකකයකට රු. 7/= |
| 09.02 | | | **තේ, රසකාරක මිශ්‍රකළ හෝ නොකළ.** | |
| | 0902.40 | - | අනෙකුත් කලු තේ (පැසවූ) සහ අර්ධ වශයෙන් පැසවූ තේ | |
| | | - - - | වෙනත්: | |
| | 0902.40.91 | - - - - | මුලුමනින්ම ශ්‍රී ලාංකිය සම්භවයෙන් යුත් බවට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහතික කරන ලද්දා වූ, රසකාරක යෙදූ | කි.ග්‍රෑමයට රු. 10/- හෝ අදාළ සතියෙහි කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය තේ මිලෙන් 2.5% යන අගයන්ගෙන් ඉහළ අගය |
| | 0902.40.92 | - - - - | මුලුමනින්ම ශ්‍රී ලාංකිය සම්භවයෙන් යුත් බවට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහතික කරන ලද්දා වූ, වෙනත් | කි.ග්‍රෑමයට රු. 10/- හෝ අදාළ සතියෙහි කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය තේ මිලෙන් 2.5% යන අගයන්ගෙන් ඉහළ අගය |
| | 0902.40.93 | - - - - | වෙනත්, රසකාරක යෙදූ | කි.ග්‍රෑමයට රු. 10/- හෝ අදාළ සතියෙහි කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය තේ මිලෙන් 2.5% යන අගයන්ගෙන් ඉහළ අගය |
| | 0902.40.99 | - - - - | වෙනත් | කි.ග්‍රෑමයට රු. 10/- හෝ අදාළ සතියෙහි කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය තේ මිලෙන් 2.5% යන අගයන්ගෙන් ඉහළ අගය |
| 23.02 | | | **ධාන්‍ය හෝ රනිල වර්ගයේ ශාක පෙනේරයකින් හැලීමෙන්, වනේ හෝ මෝලේ ලා කෙටීමෙන් හෝ අන් ක්‍රියාවලියකින් ලබාගන්නා, ගුලි ආකාරයේ වූ හෝ නොවූ, නිවුඩු, ඇගිටි සහ වෙනත් අවශේෂ කොටස්.** | |
| | 2302.10 | - | බඩ ඉරිඟු (ඉරිඟු) වලින් | කිලෝ ග්‍රෑමයකට රු. 1 /= |
| | 2302.40 | - | අනෙකුත් ධාන්‍ය වලින් : | |
| | 2302.40.10 | - - - | සහල් | කිලෝ ග්‍රෑමයකට රු. 1 /= |
| 25.04 | | | ස්වාභාවික මිනිරන් | |
| | 2504.90 | - | අනෙකුත්: | |
| | 2504.90.10 | - - - | ඉවතලන | මෙ.ටොන් 1 කට රු. 200/- |
| | 2504.90.90 | - - - | අනෙකුත්: | මෙ.ටොන් 1 කට රු. 10,000/- |
| 25.05 | | | **පරිච්ඡේද අංක 26 යටතේ වැටෙන ලෝහ ඛණිජ වැලි වර්ග හැර, වර්ණ කළ හෝ නොකළ සියලුම වර්ගවල ස්වාභාවික** | |

| | | | | |
|---|---|---|---|---|
| | | | **වැලි.** | |
| | 2505.10 | - | සිලිකා වැලි හා තිරුවාණා වැලි | |
| | 2505.10.10 | - - - | ඉවතලන | මෙ.ටොන් 1 කට රු.1,250/- |
| | 2505.10.90 | - - - | අනෙකුත්: | මෙ.ටොන් 1 කට රු.1,250/- |
| | 2505.90 | | අනෙකුත්: | මෙ.ටොන් 1 කට රු.5,000/- |
| **25.06** | | | **තිරුවානා (ස්වාභාවික වැලි හැර) ; සෘජුකෝණාශ්‍රාකාර (හතරැස් ඒවා ඇතුලු) හැඩයේ ගල්කුට්ටි හෝ පැතලි කැබලිවලට ඉරීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් කැපීම හෝ රළු ලෙස හැඩ කැපීම පමණක් කළ හෝ නොකළ තිරුවානා පාෂාණ.** | |
| | 2506.10 | - | තිරුවානා : | |
| | 2506.10.10 | - - - | අගය එකතු නොකළ (අමු) ධමනි තිරුවානා | මෙ.ටොන් 1 කට රු. 4,400/- |
| **25.07** | 2507.00 | | **භෂ්ම කළ හෝ නොකළ ක්‍රෙඹලින් සහ අනෙකුත් ක්‍රෙඹලින් මැටි වර්ග.** | මෙ. ටොන් 1 කට රු. 1,100/- |
| **25.10** | | | **ස්වභාවික කැල්සියම් පොස්පේට්, ස්වභාවික ඇලුමිනියම් කැල්සියම් පොස්පේට් සහ පොස්පටික හුණු.** | |
| | 2510.10 | - | නොඇඹරූ : | |
| | 2510.10.10 | - - - | පාෂාණ පොස්පේට් | මෙ.ටොන් 1 කට රු. 4,400/- |
| **25.13** | | | **පියුමයිස් ගල් ; ඇමරි ; ස්වභාවික කොරන්ඩම්, ස්වභාවික රබහ (ගානට්) සහ තාපයෙන් පදම් කළා වූ හෝ නොකළ අනෙකුත් ස්වභාවික අවසිරුම් ද්‍රව්‍ය (ඇබ්‍රසිව්).** | |
| | 2513.20 | - | ඇමරි ස්වභාවික කොරන්ඩම් ස්වභාවික රබහ සහ අනෙකුත් ස්වභාවික ද්‍රව්‍ය (ඇබ්‍රසිව්) | මෙ.ටොන් 1 කට රු. 24,200/- |
| **25.16** | | | **සෘජුකෝණාශ්‍රාකාර හැඩයේ (චතුරශ්‍රාකාර ඇතුළුව) කුට්ටිවලට හෝ පැතලි කැබලිවලට ඉරීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් කැපීම පමණක් කළාවූ හෝ නොකළාවූ රළු ලෙස හැඩ කැපුවාවූ හෝ නොකැපුවාවූ කළුගල් පෝර්පිරි බැසෝල්ට් වැලිගල් සහ අනෙකුත් ස්මාරක හෝ ගොඩනැගිලි සඳහා වූ ගල්.** | |
| | | - | කළුගල් (ග්‍රැනයිට්) : | |
| | 2516.11 | - - | රළු හෝ දළ ලෙස හැඩ කැපූ | කියුබික් මීටර් 1 කට රු. 24,000/- |
| | 2516.12 | - - | සෘජුකෝණාශ්‍රාකාර හැඩයේ (චතුරශ්‍රාකාර ඇතුළුව) කුට්ටිවලට හෝ පැතලි කැබලිවලට ඉරීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් කැපීම පමණක් කළාවූ | කියුබික් මීටර් 1 කට රු. 12,000/- |
| **25.16** | 2516.20 | - | වැලිගල් | කියුබික් මීටර් 1 කට රු. 12,000/- |
| | 2516.90 | - | අනෙකුත් ස්මාරක හෝ ගොඩනැගිලි සඳහා වූ ගල් | කියුබික් මීටර් 1 කට රු. 12,000/- |
| **25.17** | | | **තාපයෙන් පදම් කළ හෝ නොකළ ගිනිගල් හා ගල් පතුරු, පාරවල් වලට ඇතිරීම සඳහා හෝ දුම්රියවල හෝ වෙනත් පිරවුම් කටයුතු ලෙස යොදා භාවිතා කරන කොන්ක්‍රීට් ස්මාරකයන් සඳහා යොදාගන්නාවූ කළුගල්, බොරළු හා කැඩූ හෝ පොඩිකළ ගල් ශීර්ෂයේ මුල් කොටසේ සඳහන් කර ඇති ද්‍රව්‍ය අන්තර්ගත වූ හෝ නොවූ ලෝහ බොරව, මැකඩම්, මණ්ඩි හෝ එවැනි කාර්මික ඉවත ලන ද්‍රව්‍ය, ශීර්ෂ 25.15 හෝ 25.16 යටතේ එන තාපයෙන් පදම් කළ හෝ නොකළ ගල්.** | |
| | | - | ශීර්ෂ 25.15 හෝ 25.16 යටතේ ගැනෙන තාපයෙන් පදම් කළ හෝ නොකළ ගල්, හින් ගල් කැට ගල් පතුරු ගල් කුඩු : | |
| | 2517.49 | - - | අනෙකුත් | |

| | | | | |
|---|---|---|---|---|
| **25.25** | | | **පතුරු ඇතුළු තලාතු මිනිරන් ; තලාතු මිනිරන් අපද්‍රව්‍යයන්.** | මෙ.ටොන් 1 කට රු. 3,300/- |
| | 2525.10 | - | අශුද්ධ තලාතු මිනිරන් සහ පතුරුවලට හා තහඩුවලට පැලූ ලොකු මිනිරන් | මෙ.ටොන් 1 කට රු. 1,100/- |
| | 2525.30 | - | තලාතු මිනිරන් අපද්‍රව්‍යයන් | මෙ.ටොන් 1 කට රු. 110/- |
| **25.26** | | | **ඍජුකෝණාස්‍රාකාර (සම චතුරශ්‍රාකාර ඇතුළුව) හැඩයේ කුට්ටිවලට හෝ පැතලි කැබලිවලට, ඉරීමෙන් හෝ අන් ක්‍රමයකින් රළු ලෙස හැඩ කැපීම හෝ කැපීම පමණක් හෝ කළ හෝ නොකළ ස්වාභාවික සබන් ගල් (ස්ටිටයිට්) ; ටැල්ක්.** | |
| | 2526.10 | - | පොඩි නොකළ, කුඩු නොකළ | මෙ.ටොන් 1 කට රු. 3,300/- |
| | 2526.20 | - | පොඩි කළ හෝ කුඩු කළ | මෙ.ටොන් 1 කට රු. 2,200/- |
| **25.30** | | | **අන්තැනක නිශ්චිතව සඳහන් නොකළා වූ හෝ ඇතුළත් නොකළාවූ ඛනිජ ද්‍රව්‍යයන්.** | |
| | 2530.10 | - | ප්‍රසාරණය නොවූ වර්මිකියුලයිට්, පර්ලයිට් සහ ක්ලෝරයිඩ් වර්ග | මෙ.ටොන් 1 කට රු. 1,100/- |
| | 2530.20 | - | කිසරයිට්, එප්සොමයිට් (ස්වාභාවික මැග්නීසියම් සල්ෆේට් වර්ග) | මෙ.ටොන් 1 කට රු. 1,100/- |
| | 2530.90 | - | අනෙකුත් : | |
| | 2530.90.10 | - - - | ස්වභාවික ආසනික් සල්ෆයිඩ | මෙ.ටොන් 1 කට රු. 1,100/- |
| | 2530.90.20 | - - - | කැඩුනු කොන්ක්‍රීට් කැබලි | මෙ.ටොන් 1 කට රු. 1,100/- |
| | 2530.90.90 | - - | අනෙකුත් | මෙ.ටොන් 1 කට රු. 1,100/- |
| **26.14** | 2614.00 | | **ටයිටේනියම් නිධි සහ සාන්ද්‍රණ :** | |
| | 2614.00.10 | - - - | ඉල්මනයිට් | මෙ.ටොන් 1 කට රු. 1,650/- |
| | 2614.00.20 | - - - | රූටයිල් | මෙ.ටොන් 1 කට රු. 2,200/- |
| | 2614.00.90 | - - - | අනෙකුත් | මෙ.ටොන් 1 කට රු. 1,100/- |
| **26.15** | | | **නියෝබියම්, ටැන්ටලම්, වැනේඩියම් හෝ සර්කෝනියම් නිධි සහ සාන්ද්‍රණ.** | |
| | 2615.10 | - | සර්කෝනියම් නිධි සහ සාන්ද්‍රණ | මෙ.ටොන් 1 කට රු. 550/- |
| | 2615.90 | - | අනෙකුත් | මෙ.ටොන් 1 කට රු. 110/- |
| **40.01** | | | **මූලික ස්වරූපයෙන් හෝ තැටි රොටි හෝ තීරුවල ස්වරූප ඇත්තාවූ ස්වභාවික රබර්, බැලාටා, ගාටා-පර්චා, ගුවායුලේ, චිකල් සහ ඒ හා සමාන වූ ස්වභාවික මැලියම් වර්ග.** | |
| | 4001.10 | - | ප්‍රි - වල්කනයිස් කළා වූ හෝ නොකළා වූ ස්වභාවික රබර් කිරි ඒ | |
| | 4001.10.10 | - - - | කේන්ද්‍රාපසාරික රබර් | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.10.90 | - - - | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 4/- |
| | | - | වෙනත් ආකාරයේ වූ ස්වාභාවික රබර් : | |
| | 4001.21 | - - | දුම්ගැසූ රොටි ඒ | |
| | 4001.21.10 | - - - | ආර්. එස්. එස්. 1 | කි. ග්‍රෑමයට රු. 4/- |

| | | | | |
|---|---|---|---|---|
| | 4001.21.20 | - - - | ආර්. එස්. එස්. 2 | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.21.30 | - - - | ආර්. එස්. එස්. 3 | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.21.40 | - - - | ආර්. එස්. එස්. 4 | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.21.50 | - - - | ආර්. එස්. එස්. 5 | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.21.90 | - - - | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.22 | - - | තාක්ෂණිකව විශේෂිත ස්වාභාවික රබර් (ටීඑස්එන්ආර්) | කි. ග්‍රෑමයට රු. 4/- |
| **40.01** | 4001.29 | - - | අනෙකුත් : | |
| | | - - - | ක්‍රේප් : | |
| | 4001.29.13 | - - - - | දුඹුරු | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.29.14 | - - - - | කැබලි | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.29.20 | - - - | කුට්ටි රබර් | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.29.30 | - - - | නයිට්‍රජන් අඩු ස්වභාවික රබර් (එල්එන්එන්ආර්) | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.29.40 | - - - | ප්‍රෝටීන් ඉවත් කළ ස්වභාවික රබර් (ඩීපීඑන්ආර්) | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.29.50 | - - - | එම්ජි රබර් | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.29.60 | - - - | එස්පී රබර් | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.29.70 | - - - | අනෙකුත් රසායනිකව වෙනස් කරන ලද ආකාරවල රබර් | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.29.90 | - - - | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 4/- |
| | 4001.30 | - | බැලැටා, ගාටා-පර්චා, ගුවායුලේ, චිකල් සහ ඒ හා සමාන ස්වභාවික මැලියම් වර්ග | කි. ග්‍රෑමයට රු. 4/- |
| **41.01** | | | **ලෝම අස් කළ හෝ නොකළ ඉරූ හෝ නොඉරූ (අළුත් හෝ ලුණු දැමූ, වියළූ, හුණු ගැල් වූ, ලවණ සහිත තනුක ආම්ලික ද්‍රාවනයක දැමූ හෝ වෙනත් අන්දමකින් කල් තබා ගැනීමට සැලසුවා වූ, නමුත් පදම් නොකළා වූ, ලිවීමට යෝග්‍ය ලෙස පදම් නොකළාවූ හෝ ඊට වැඩියෙන් සකස් නොකළා වූ) ගව වර්ගයේ හෝ අශ්ව වර්ගයේ සතුන්ගේ අමු ඝන හම් සහ තුනී හම් (මී හරකුන්ගේ ද ඇතුළුව).** | |

| | | | | |
|---|---|---|---|---|
| | 4101.20 | - | හමක බර සරලවා වියලු විට කි.ග්‍රෑ. 8 ක් නොඉක්මවන්නාවූ ද වියළි ලුණු යෙදූ විට බර කි.ග්‍රෑ. 10 ක් නොඉක්මවන්නාවූ ද<br>හෝ අළුත්ව තිබියදී තෙත ලුණු යොදා හෝ අන් අයුරකින් කල් තබා ගැනීමට සැලසූ විට බර කි.ග්‍රෑ. 16 නොඉක්මවන්නාවූ<br>ද ගව වර්ගයට අයත් සතුන්ගේ පතුරු නොගැසූ සම්පූර්ණ ඝන හම් හෝ තුනී හම | 75% හෝ කි. ග්‍රෑමයට රු. 500/- |
| | 4101.50 | - | බර කි.ග්‍රෑ. 16 ඉක්මවන්නා වූ සම්පූර්ණ ඝණ හම් හෝ තුනී හම් | 75% හෝ කි. ග්‍රෑමයට රු. 500/- |
| | 4101.90 | - | අනෙකුත් (කොන් කැලි, නැමි කැලි සහ බඳවල් ඇතුළුව) | 75% හෝ කි. ග්‍රෑමයට රු. 500/- |
| **41.02** | | | **මෙම පරිච්ඡේදයෙහි 1 (ඇ) සටහනෙන් බැහැරකරණ ලද ඒවා හැර ලෝම සහිත හෝ ලෝම රහිත වූ හෝ ඉරූ හෝ නොඉරූ (අළුත් හෝ ලුණු දැමූ, වියලූ, හුණු ගැල්වූ, ආම්ලිකමය<br>ද්‍රාවණයක දැමූ හෝ වෙනත් අන්දමකින් කල් තබාගැනීමට සැලසුවා වූ නමුත් පදම් නොකළා වූ, ලිවීම, ඩයි ගැන්වීම වැනි කාර්යයන් සඳහා යෝග්‍ය අන්දමට පදම් නොකළා වූ හෝ ඊට වැඩියෙන් සකස් නොකළා වූ) බැටළුවන්ගේ හෝ බැටළු පැටවුන්ගේ අමු තුනී හම්.** | |
| | 4102.10 | - | ලෝම සහිත | 75% හෝ කි. ග්‍රෑමයට රු. 500/- |
| | | - | ලෝම රහිත : | |
| | 4102.21 | - - | තනුක ආම්ලික ලවණ ද්‍රාවණයක දැමූ | 75% හෝ කි. ග්‍රෑමයට රු. 500/- |
| | 4102.29 | - - | අනෙකුත් | 75% හෝ කි. ග්‍රෑමයට රු. 500/- |
| **41.03** | | | **මෙම පරිච්ඡේදයේ 1 (ආ) හෝ 1 (ඇ) දරන සටහන්වලින් බැහැරකරණ ලද ඒවා හැර, ලෝම ඉවත් කළා වූ හෝ නොකළා<br>වූ හෝ ඉරූ හෝ නොඉරූ, (අළුත් හෝ ලුණු දැමූ, වියලූ, හුණු<br>ගැල්වූ, තනුක ආම්ලික ලවණ ද්‍රාවණයක දැමූ හෝ වෙනත් අන්දමකින් කල් තබාගැනීමට සැලසුවා වූ නමුත් පදම් නොකළා<br>වූ, හෝ ලිවීමට, වර්ණ ගැන්වීම වැනි කාර්ය වලට යෝග්‍ය නමුත් පදම් නොකළා වූ හෝ ඊට වැඩියෙන් සකස් නොකළා වූ) අනෙකුත් අමු ඝන හම් වර්ග සහ තුනී හම් වර්ග.** | |
| | 4103.20 | - | උරගයන්ගේ | 75% හෝ කි. ග්‍රෑමයට රු. 500/- |
| | 4103.30 | - | ඌරන්ගේ | 75% හෝ කි. ග්‍රෑමයට රු. 500/- |
| | 4103.90 | - | අනෙකුත් | 75% හෝ කි. ග්‍රෑමයට රු. 500/- |
| **41.04** | | | **පැලූ හෝ නොපැලූ ලෝම සහිත හෝ ඉවත් කළ, එහෙත් තවදුරටත් පිළියෙල කිරීම් නොකළ ගවාදී (මීහරක් ද ඇතුළත්ව<br>හා අශ්වයන්ගේ පදම් කළ හෝ පෘෂ්ඩය දැඩිකළ ඝණ හම් සහ<br>තුනී හම්.** | |
| | | | තෙත් තත්ත්වය ඇති (වෙට් බ්ලූ ඇතුළත්ව) : | |
| | 4104.11 | - - | ෆුල් ග්‍රේන්ස්, නොඉරූ, ග්‍රේන්ස් ස්පිල්ට්ස් : | |
| | 4104.11.10 | - - - | වෙට් බ්ලූ ක්‍රෝම් ටැන් | 10% |
| | 4104.11.90 | - - - | අනෙකුත් | 10% |
| | 4104.19 | - - | අනෙකුත් | |
| | 4104.19.10 | - - - | වෙට් බ්ලූ ක්‍රෝන් ටැන් | 10% |

| | | | | |
|---|---|---|---|---|
| | 4104.19.90 | - - - | අනෙකුත් | 10% |
| | | - | වියළි තත්ත්වය (දැඩි පෘෂ්ඨ) : | |
| | 4104.41 | - - | පුල් ග්‍රේන්ස්, නොඉරූ, ග්‍රේන්ස් ස්පිල්ට්ස් : | 10% |
| | 4104.49 | - - | අනෙකුත් | 10% |
| **41.05** | | | **මතුපිට ලෝම රහිත වූ ඉරූ හෝ නොඉරූ එහෙත් තවදුරටත් පිළියෙල නොකළ බැටළුවන්ගේ හෝ බැටළු පැටවුන්ගේ පදම් කළ හෝ වියළි හම්.** | |
| | 4105.10 | - | තෙත් ත්ත්තවය (වෙට් බ්ලූ ඇතුළුව) | |
| | 4105.30 | - | වියළි තත්ත්වය (ක්‍රස්ට්) | 10% |
| **44.03** | | | **පොත්ත හෝ වළය රහිත ලද්දා වූ හෝ නොලද්දා වූ, හෝ දළ ලෙස හතරැස් ආකාරයට රහිනු ලැබූ, දළ ආකාරයෙන් වූ දැව.** | |
| | | - | අනෙකුත් | |
| | 4403.99 | - - | අනෙකුත් | 15% |
| **72.04** | | | **යකඩමය ඉවත ලන දෑ සහ සුන්බුන් ; වානේ හෝ යකඩවල නැවත උණු කිරීමට ගන්නා සුන්බුන් ලෝහ කුට්ටි.** | |
| | 7204.10 | - | වාත්තු කළ යකඩ වල ඉවත ලන දෑ සහ සුන්බුන් | 10% |
| | | - | වානේ මිශ්‍ර ලෝහ වල ඉවත ලන දෑ සහ සුන්බුන් : | |
| | 7204.21 | - - | මළ නොබැඳෙන වානේ වල | |
| | 7204.29 | - - | අනෙකුත් | 10% |
| | 7204.30 | - | ටින් ගෑ යකඩ හෝ වානේ වල ඉවතලන දෑ සහ සුන්බුන් | |
| | | - | අනෙකුත් ඉවතලන දෑ සහ සුන්බුන් : | 10% |
| | 7204.41 | - - | මිටි බැඳි හෝ එසේ නොබැඳි, සුරුණ්ඩු, යතුරොඩු, පතුරු, ඇඹරුම් කප්පි, ලී කුඩු, පිරවුම්, අහුකොන් සහ පොඩි කළ ලෑල | 10% |
| | 7204.49 | - - | අනෙකුත් | 10% |
| | 7204.50 | - | නැවත උණුකරන ලෝහ කුට්ටි සුන්බුන්. | 10% |
| **74.04** | 7404.00 | | **තඹ වල ඉවත ලන දෑ සහ සුන්බුන්.** | 50% |
| **75.03** | 7503.00 | | **නිකල් වල ඉවත ලන දෑ සහ සුන්බුන්.** | 25% |
| **76.02** | 7602.00 | | **ඇලුමිනියම් වල ඉවතලන දෑ සහ සුන්බුන්.** | 25% |
| **78.02** | 7802.00 | | **ඊයම් වල ඉවතලන දෑ සහ සුන්බුන්.** | 25% |
| **79.02** | 7902.00 | | **තුත්තනාගම් වල ඉවතලන දෑ සහ සුන්බුන්.** | 25% |
| **80.02** | 8002.00 | | **ටින් වල ඉවතලන දෑ සහ සුන්බුන්.** | 25% |

## C. රේගු විභාගය

ප්‍රධාන අපනයන නිලධාරියා විසින් කුමන වර්ගයේ පරීක්ෂණයක් පැවැත්විය යුතුදැයි තීරණය කරනු ලබයි. විභාගය, අපනයනය කරන්නාගේ සේවා ස්ථානයේ හෝ බඩු ගබඩාවේ හෝ බහාලුම් පර්යන්තයේ පැවැත්විය යුතුය. ඉන්පසු ඔහු විසින් "Panel Examination" හෝ "Cargo to be Examined" හෝ "Seals to be checked" වශයෙන් අවශ්‍ය මුද්‍රාව CUSDEC හි තබනු ඇත.

ප්‍රධාන අපනයන නිලධාරියා විභාගයක් පැවැත්වීම අනවශ්‍ය යැයි තීරණය කළහොත් ඔහු බඩුතොගය තීරුවෙන් නිදහස් කර, CUSDEC හි "Exempted" හි මුද්‍රාව දමා විසර්ජන කවුන්ටරය වෙත යවනු ඇත.

## 12. වරාය ක්‍රියාපටිපාටිය

### A. වරායේ ගාස්තුව

වරායට බඩු ගෙනයාමට පෙර අපනයනකරු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ (SLPA) මූල්‍ය අංශයට මුදල් ගෙවිය යුතුය. ගාස්තු ගෙවීමේදී මෙම අංශයට සම්පූර්ණ කළ නාවික සටහන් පත්‍රයේ පිටපත් තුනක් (EXP 3a) ලබාදිය යුතුය. එක්වරක් ගාස්තු ගෙවූ පසු මූල්‍ය කළමණාකරු එක් පිටපතක් තබාගෙන අපනයනකරුට ඉතිරි පිටපත් දෙක ලබාදේ. මේවා ගාස්තු ගෙවූ නැව් නෝට්ටු ලෙස හඳුන්වනු ලබයි. මෙම ගාස්තු ගෙවූ නැව් නෝට්ටු පිටපත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සේවා සපයන සියළුම වරාය වලදී ආනයන සහ අපනයන කටයුතු සඳහා වලංගු වේ.

මේ ගාස්තු පහත පරිදි වර්ග කළ හැක:

1. ගොඩ බැසීම් සහ ප්‍රවාහන ගාස්තු (Landing & Delivery Charges)
2. නැව් ගාස්තු (Shipping Charges)
3. බැඳුම් සහ රේගු ගාස්තු (Bonding/Entrepot Trade)
4. දොඹකර ගාස්තු (Crane Charges)
5. වෘත්තිය ගාස්තු සහ කුලිය (Occupation & Rent)
6. සේවාවන් සඳහා වෙනත් උපයෝගි ගාස්තු (අදාල නම්)

### B. වරායට බඩුතොග ගෙන යෑම

වරායට බඩුතොග ගෙන යන විටදී පහත සඳහන් ලේඛනයන් සකස් කර SLPA හෝ අපනයන කාර්යාලයට භාරදිය යුතුය.

1. නැව් නෝට්ටුව (3a පෝරමය) (Shipping Note)

   පිටපත් පහක් යොමු කළ යුතුය

2. බඩු තොග එවූ නෝට්ටුව (3b පෝරමය) (Cargo Dispatch Note – CDN පෝරමය)

   පිටපත් හයක් යොමු කළ යුතුය

ඊට අමතරව, නැව් නෝට්ටුව (ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගෙවීම්පත) සහ CUSDEC ද (සුරැකුම් කොපිය) ඇමිණිය යුතුය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අපනයන කාර්යාලයෙහි ලියාපදිංචිකර පරික්ෂා කිරීමෙන් පසු බඩු තොගය, අපනයනකරු විසින් ජැටිය වෙත ගෙනයා යුතුය.

බඩු තොග සියල්ල පටවනු ලැබීමෙන් පසු නැවේ කපිතාන් විසින් අත්සන තැබීමත් සමග නැව් නෝට්ටුව Mate's Receipt බවට පත්වේ. එම Mate's Receipt ය නැවෙහි සිටින වරාය අධිකාරියේ නිලධාරියා විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අපනයන කාර්යාලය වෙත යවනු ලැබේ.

අපනයනකරු විසින් Mate's Receipt හි ඔහුගේ පිටපත ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අපනයන කාර්යාලයෙන් ලබාගෙන නැවත එය නැව් නියෝජිතයා වෙත ලබාදී ඔහු වෙතින් නෞභාර බිල්පත Bill of Lading (B/L) ලබාගත යුතුය.

මෙම අදියරේදී අපනයනකරුට නැව් නියෝතයා වෙත ගැල් කුලී ගාස්තු (Freight Charges) ගෙවීමට සිදුවනු ඇත. (අවශ්‍ය නම්)

## 13. වාණිජ බැංකුව වෙත ලේඛණ ඉදිරිපත් කිරීම

නැව් මගින් භාණ්ඩ අපනයනය කිරීමේ ක්‍රියාවලියේ අවසන් අදියර වන්නේ පහත සඳහන් ලේඛන බැංකුවට ඉදිරිපත් කිරීමයි. ඒවා නම්,

1. වාණිජ ඉන්වොයිසිය Commercial Invoice
2. නැව්භාර පත්‍රේ Bill of Lading මුල් පිටපත / A.W.B අංකය
3. රක්ෂණ සහතිකය (CIF නම්)
4. විනිමය සටහන් (DP හෝ DA කොන්දේසි මතනම්)
5. ණයවර ලිපිය
6. ප්‍රභවස්ථාන සහතිකය / GSP සහතිකය
7. ඇසුරුම් ලයිස්තුව

මිළදී ගන්නාගේ ඉල්ලීම මත පහත පරිදි ලේඛන ඉදිරිපත් කළ යුතුය.

1. තත්ත්ව සහතික
2. සෞඛ්‍ය සහතික
3. Phytosanitary සහතිකය
4. දුම් ගැසීම ඉෂ්ට කිරීම ඔප්පු කරන සහතිකය
5. HACCAP සහතික (ආහාර සඳහා)
6. අනෙකුත් සහතික හෝ Global GAP / GMP වැනි පරීක්ෂණ වාර්තා

### A) ණයවර ලිපි (LC) නියමයන් මත අපනයනය කිරීම

භාණ්ඩ තොගයක් සඳහා L/C ස්ථාපනය කර ඇත්නම්, සියළුම නැව්ගත කිරීමේ ලේඛන උපදේශක බැංකුවට (අපනයනකරුගේ බැංකුවට) ඉදිරිපත් කළ යුතුය. L / C හි සඳහන් සියළු කොන්දේසි නියමාකාරයෙන් සම්පූර්ණව ඇති බවට අපනයනකරු විසින් සහතික කරගත යුතුය. මෙම අදියරේදී ලිපි ලේඛන සම්බන්ධයෙන් සාකච්ඡා කළ හැකි අතර නැව්ගත භාණ්ඩ සඳහා වන මුදල් අපනයනකරුට ලබාගත හැකිය. ඉහත ලේඛනවල පිටපත් හැකි ඉක්මණින් මිලදීගන්නා වෙත යැවිය යුතුය.

### B) ගෙවීම් පිට ලියවිලි (DP) නියමයන් මත අපනයනය කිරීම

ගණුදෙනුව ගෙවීම් පිට ලේඛන (D/ P terms) නියමයන් මත සිදුවේ නම්, භාණ්ඩ නැව්ගත කිරීමෙන් අනතුරුව අපනයනකරු (විකුණුම්කරු) විසින් ගාස්තු ගෙවීමේ කටයුතු සඳහා විනිමය බිල්පත (Sight Bill) සමග අනෙකුත් නැව් ලේඛන ගැනුම්කරුගේ බැංකුව වෙත යවනු ලැබේ.

### C) ප්‍රතිග්‍රහනය මත ලියවිලි (DA) නියමයන් මත අපනයනය කිරීම

ගණුදෙනුව ප්‍රතිග්‍රහනය මත ලේඛන (D/A term) නියමයන් මත සිදුවේ නම්, භාණ්ඩ නැව්ගත කිරීමෙන් අනතුරුව අපනයනකරු (විකුණුම්කරු) විසින් ගාස්තු ගෙවීමේ කටයුතු සඳහා විනිමය බිල්පත (Terms Bill කොන්දේසි පත) සමග අනෙකුත් නැව් ලේඛන ගැනුම්කරුගේ බැංකුව වෙත යවනු ලැබේ.